සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 06 - ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව

නම/විභාග අංකය :- ........................................................................ කාලය: පැය 02 යි.

I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට නිවැරදි නම් "✓" ලකුණ ද වැරදි නම් "✗" ලකුණ ද යොදන්න.

(01) වෙස් මුහුණකින් විවිධ හැඟීම් නිරූපණය කරයි. ( )

(02) රූපණය යනු රඟපෑමයි. ( )

(03) පිරිත් මල්දම උපදේශාත්මක කාව්‍ය සංග්‍රහයකි. ( )

(04) අංග රචනය යනු නළුවා විසින් අඳින පළඳින ඇඳුම් පැළඳුම් ය. ( )

(05) තම පරිකල්පනය මෙහෙයවා කරනු ලබන නිර්මාණ ස්වතන්ත්‍ර නිර්මාණ වේ. ( )

- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පහත වරහන තුළ ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

(නළුවරණය, ආනුෂංගික කලා, ජසයා, තේමාව, බටතොළු ආච්චි)

(06) නාට්‍යයක් සඳහා භාවිත කරන අනෙකුත් කලාවන් ........................................................ ලෙස හඳුන්වයි.

(07) කතා වස්තුවෙන් කියවෙන ප්‍රධාන අදහස ........................................ යනුවෙන් හඳුන්වයි.

(08) නාට්‍යයකට නළු නිළියන් තෝරා ගැනීම ........................................ යනුවෙන් හඳුන්වයි.

(09) ........................................ කෝලම් නාටකයේ වෙස් මුහුණු පැළඳ රඟන චරිතයකි.

(10) ........................................ අති මානුෂීය චරිතයක් ලෙස ප්‍රසිද්ධ ය.

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) හඬ නිපදවීම සඳහා යොදාගත හැකි ආදේශ භාණ්ඩයක් නොවන්නේ,
(1) එක්ස්රේ කොළය (2) බිස්කට් ටින් එකක් (3) රබාන (4) වැලි පිරවූ බඳුනක්

(12) තමා දකින දෙයක් ඒ ආකාරයෙන් ම කර පෙන්වීම,
(1) අභිරූපණය යි. (2) අනුකරණය යි. (3) අභිනය යි. (4) සමාරෝපය යි.

(13) නාට්‍ය පිටපතක ඇතුළත් නොවේ.

(1) සංවාද (2) චරිත (3) රංග විධාන (4) රූපණය

(14) නාට්‍යය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) අවස්ථාවක් හෝ සිද්ධියක් පාදක කොටගෙන ඇත.

(2) රංගය සඳහා ම සුදානම් කළ හැකි ය.

(3) ප්‍රේක්ෂකයා අරමුණු කරගෙන නිර්මාණය වේ.

(4) පිටපතක් අවශ්‍ය නොවේ.

(15) ජනමාධ්‍ය අතරට අයත් නොවන්නේ,

(1) රූපවාහිනිය (2) ගුවන් විදුලිය (3) පුවත්පත් (4) දුරකතනය

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර යා කරන්න.

| | | |
|---|---|---|
| (16) | යමක් කර පෙන්වීම | • නාට්‍ය ගීතයකි. |
| (17) | කැත්තක් අරගෙන වත්තට යනකොට | • සිරිත් මල්දම. |
| (18) | ආදරේ ඇයි පොඩි හඳ මාමේ | • රඟන් පදයකි. |
| (19) | "පෙල්ලම් සිහින්වත් - යම් කිසි තරහකින්වත්" | • නාට්‍යය යි. |
| (20) | ඇහැළ මලින් ගස් පිරිලා | • ළමා ගීතයකි. |

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සමඟ 2,3 සහ 4 ප්‍රශ්නයන්ගෙන් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

(01) හුරුබුහුටියි මේ පැටවුන්
අභිංසකයො වගේ පෙනෙයි
මගෙ පාලුවටත් එක්කල
ඉඳුම් හිටුම් දීම හොඳයි.

(i) මෙම සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යයේ නම ලියන්න. (ලකුණු 02)

(ii) මෙම නාට්‍යයේ අධ්‍යක්ෂකගේ නම ලියන්න. (ලකුණු 03)

(iii) මෙම නාට්‍යයේ ඇතුළත් ප්‍රධාන චරිතය නම් කරන්න. (ලකුණු 03)

(iv) ඉහත සංවාද ඛණ්ඩය ඉදිරිපත් කරනු ලබන්නේ කවුරුන් විසින් ද? (ලකුණු 03)

(v) මෙම නාට්‍යයේ ඇතුළත් වෙනත් චරිත 02ක් නම් කරන්න. (ලකුණු 03)

(vi) මෙම නාට්‍යයෙන් ගත හැකි ආදර්ශය කුමක් ද? (ලකුණු 03)

(vii) ඔබ දන්නා තවත් වේදිකා නාට්‍යයක් නම් කරන්න. (ලකුණු 03)

(02) (i) ඔබ දන්නා ජන ක්‍රීඩා 4ක් නම් කරන්න. (ලකුණු 04)

(ii) ඉන් එක් ජන ක්‍රීඩාවකට අයත් කවියක් ලියන්න. (ලකුණු 08)

(iii) ජන ක්‍රීඩාවල නිරත වීම තුළින් ජීවිතයට ලබාගත හැකි ප්‍රයෝජන 04ක් ලියන්න. (ලකුණු 08)

(03) (i) රංගාභරණ යනු මොනවා ද යි හඳුන්වන්න. (ලකුණු 04)

(ii) රංගාභරණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 03ක් ලියන්න. (ලකුණු 06)

(iii) පන්ති කාමරයේ දී ඔබ සාදන ලද රංගාභරණයක් ඇඳ එය නිර්මාණය කර ගන්නා ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරන්න. (ලකුණු 10)

(04) (i) ඔබ දන්නා ජනකතා 04ක් නම් කරන්න. (ලකුණු 04)

(ii) ඔබ දන්නා ජන කතාවක් ඇසුරින් නාට්‍ය පිටපතක් රචනා කරන්න. (ලකුණු 16)

(05) (i) අභිනය යනු කුමක් ද යි හඳුන්වන්න. (ලකුණු 04)

(ii) අභිනය ප්‍රභේදය කීය ද? ඒවා නම් කරන්න. (ලකුණු 06)

(iii) ඉන් එක් අභිනයක් විස්තර කරන්න. (ලකුණු 10)